ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
இலங்கை பௌத்த பாளி பல்கலைக்கழகம்
**BUDDHIST AND PALI UNIVERSITY OF SRI LANKA**
නො.37, මොරගහහේන පාර, පිටිපන නගරය, හෝමාගම.
இல.37, மொரகஹஹேன வீதி, பிட்டிபனை நகரம், ஹோமாகம
No.37, Moragahahena Road, Pitipana Town, Homagama

උපකුලපති / உப வேந்தர் / Vice - Chancellor: 011-2593397, 011-2857785

ලේඛකාධිකාරී / பதிவாளர் / Registrar: 011-2891105

විභාග අංශය / කාර්යාලය / பரீட்சைகள் பிரிவு / அலுவலகம் / Exam Branch/Office: 011-2857784, 011-2857786

Fax : 0094-11-2857784
E-Mail : exam@bpu.ac.lk

මාගේ අංකය / எனது இலக்கம் / My Number: BPU/EX-05/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your Number:

2024.01.18

ගෞරවාර්හ ස්වාමීන් වහන්ස/මහත්මයාණෙනි,

**<u>23 වන උපාධි ප්‍රදානෝත්සවය සඳහා ලියාපදිංචි කිරීම - 2024 අප්‍රේල් 04</u>**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ විසිතුන්වන (23) උපාධි ප්‍රදානෝත්සවය **2024 අප්‍රේල් මස 04 වන දින කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ප.ව. 1.00** ට පවත්වන බව, ඔබ වහන්සේට/ඔබට මෙයින් දැනුම් දෙමි.

මේ සඳහා සුදුසුකම් ඇති ඔබ වහන්සේ/ඔබ විසින් මේ සමඟ එවා ඇති 2024 උපාධි ප්‍රදානෝත්සවය සඳහා ලියාපදිංචි වීමේ අයදුම්පත හා ආදි විද්‍යාර්ථීන්ගේ තොරතුරු ලබා ගැනීමේ අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර එවන මෙන් දන්වා සිටිමි.

**ඉතා වැදගත් :**

**ඔබ වහන්සේ/ඔබ විසින් 2024.02.05 වන දින හෝ ඊට පෙර උපාධි උත්සවය සඳහා ලියාපදිංචි විය යුතු වේ. ඉන් පසුව කිසිම හේතුවක් නිසා හෝ ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් භාර ගනු නොලැබේ.**

**<u>උපාධිය පිරිනැමීමට සුදුසුකම් ලබන අය :</u>**

පහත සඳහන් ප්‍රථම උපාධි පරීක්ෂණය සමත් වූ ගිහි පැවිදි සියළු ම (අභ්‍යන්තර) උපාධිලාභීහු මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධිය පිරිනැමීමට සුදුසුකම් ලබති.

(අ) 2017/2018/2019 වර්ෂයන්හි ලියාපදිංචි (විශේෂ/සාමාන්‍ය) ශාස්ත්‍රවේදී උපාධිලාභීන්

**<u>ලියාපදිංචි වීම :</u>**

මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධිය ලබා ගැනීමට අපේක්ෂා කරන සියලුම උපාධිධාරීන් අනිවාර්යයෙන් ම ලියාපදිංචි විය යුතුය.

උපාධි ප්‍රදානෝත්සවය සඳහා ලියාපදිංචි වීමේ දී පහත සඳහන් ගාස්තු ගෙවිය යුතුය.

ප්‍රථම උපාධිය (BA) - රු. 6000/-

උපාධි ප්‍රදානෝත්සවයට නොපැමිණෙන එහෙත් එම උපාධි අනුපස්ථිතියෙහි ලබා ගැනීමට බලාපොරොත්තු වන උපාධිධාරීන් ද ඉහත සඳහන් පරිදි ගාස්තු ගෙවිය යුතුය.

**අවසාන පරීක්ෂණයෙන් පසු උපැවිදි වී ඇති හා විභාග අක්‍රමිකතා සිදුකළ සියලු දෙනාට උපාධිය අනුපස්ථිතියෙහි පිරිනැමීමට පාලක සභාව විසින් තීරණය කර ඇත. මේ සඳහා ද අදාළ ගාස්තු ගෙවා ලියාපදිංචි වීම අනිවාර්යය වේ. එසේ නොවුනහොත් ඔබට උපාධි සහතිකය නිකුත් කරනු නොලැබේ.**

ඔබ වහන්සේට/ඔබට අදාළ **ලියාපදිංචි ගාස්තුව සහ අයදුම්පත සමඟ 2024.02.05 දිනට පෙර** ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉහත සඳහන් ගාස්තු ලංකා බැංකුවේ, හෝමාගම ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල ගිණුම් අංක 711201 බැරවීම පිණිස දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් පහත සඳහන් එක් ක්‍රමයක් ඔස්සේ ඔබගේ ගාස්තු ගෙවිය හැකිය.

- බැංකු ලදුපත මගින් මුදල් තැන්පත් කිරීම
- මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රය (CDM) මගින් මුදල් තැන්පත් කිරීම
- මාර්ගගත ක්‍රමය (Online) මගින් මුදල් තැන්පත් කිරීම

මුදල් ගෙවීමෙන් පසුව නිකුත් කරනු ලබන ලදුපත ඔබගේ උපාධි ප්‍රදානෝත්සව ලියාපදිංචි වීමේ අයදුම්පතට අනිවාර්යයෙන් අමුණා නියමිත දිනට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උපාධි ප්‍රදානෝත්සව සඳහා ලියාපදිංචි වීමේ අයදුම්පත - 2024"** යනුවෙන් සඳහන් කරන්න.

සහකාර ලේඛකාධිකාරී (අභ්‍යන්තර විභාග) - වැඩබලන
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
නො. 37, මොරගහහේන පාර,
පිටිපන නගරය,
හෝමාගම.

**ඡායාරූප ඉදිරිපත් කිරීම :**

උපාධි ලේඛනයට ඇතුළත් කිරීම සඳහා මෑතක දී ලබාගත ඔබගේ පාස්පෝට් ප්‍රමාණයේ ප්‍රසාදජනක වර්ණ ඡායාරූප දෙකක් එවිය යුතුය.

(ඡායාරූපයේ පිටුපස ඔබගේ නම සඳහන් කළ යුතු අතර එක් ඡායාරූපයක් මේ සමග එවා ඇති අයදුම්පත්‍රයේ ඉදිරිපස ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ ඇලවිය යුතුය. අනෙක් ඡායාරූපය ලිපි කවරයක බහා අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.)

**උපාධි ප්‍රදානෝත්සවයේ දී සැරසී සිටිය යුතු ඇඳුම :**

උපාධි ප්‍රදානෝත්සවයේ දී පැවිදි උපාධිලාභීන් විශ්වවිද්‍යාලය මගින් සපයනු ලබන අදාළ විජිනිපත දරා සිටිය යුතුය. ගිහි පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ යුරෝපීය ඇඳුමින් සැරසී විශ්වවිද්‍යාලය මඟින් සපයනු ලබන විද්පත් නේපත්‍ය (උපාධි ලෝගුව) හැඳ සාය්කය පැළඳ සිටිය යුතු ය.

**විජිනිපත් නිකුත් කිරීම හා ආපසු භාරදීම :**

පැවිදි උපාධිලාභීන් සඳහා විජිනිපත් **2024.04.04 දින පෙ.ව. 10.30 සිට (උපාධි ප්‍රදානෝත්සව දිනයේ දී)** බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී නිකුත් කෙරේ.

පැවිදි උපාධිලාභීන් සඳහා උපාධි ප්‍රදානෝත්සව දිනයේ දී විජිනිපත් නිකුත් කිරීමේ කවුළුවෙන් ලබා ගෙන උත්සවය අවසානයේ ආපසු එදිනම විජිනිපත් භාර ගැනීමේ කවුළුවට ම ගෙනවිත් භාර දිය යුතුය.

**උපාධි ලෝගු සහ සාය්ක නිකුත් කිරීම හා ආපසු භාර දීම :**

ගිහි උපාධිලාභීන් සඳහා **උපාධි ලෝගු සහ සාය්ක 2024.03.20 දින සිට 2024.03.23 දින දක්වා පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා හෝමාගම, පිටිපන, මොරගහහනේ පාරේ, අංක 37 පිහිටි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි අභ්‍යන්තර විභාග අංශයෙන් නිකුත් කෙරේ.** මෙහි දක්වා ඇති දිනවලට පෙර හෝ පසුව උපාධි ලෝගු නිකුත් නොකරන බව ද කරුණාවෙන් සලකන්න.

ගිහි උපාධිලාභීන් **2024.04.25 දින සිට 2024.04.28 දින දක්වා පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විභාග අංශයට උපාධි ලෝගුව සහ සාටකය භාරදිය යුතු ය.** ප්‍රමාද වන සෑම දිනයක් සඳහා ම රු. 50/- ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සිදු වනු ඇත. උපාධි සහතිකය නිකුත් කරනු ලබන්නේ උපාධි ලෝගු සහ සාටක ආපසු භාර දුන් පසුව පමණි.

**ජංගම දුරකථන භාවිතය :**

සියලුම ජංගම දුරකථන උපාධි ප්‍රදානෝත්සව ශාලාවට පිවිසීමේ දී ක්‍රියා විරහිත කළ යුතුය.

**ඡායාරූප ගැනීම :**

උපාධි ප්‍රදානෝත්සව ශාලාව ඇතුළත ඡායාරූප ගැනීම සඳහා ඉඩ දෙනු නොලැබේ. විශ්වවිද්‍යාලය මගින් අනුමත කර ඇති ඡායාරූප ශිල්පියෙකුට පමණක් උපාධිය පිරිනැමීමේ දී ඔබේ කැමැත්ත පරිදි ඡායාරූප ගැනීමට පහසුකම් විශ්වවිද්‍යාලය විසින් සපයනු ලැබේ. මේ පිළිබඳව විස්තර පසුව දන්වනු ලැබේ.

**ආරාධිතයින් සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම :**

උපාධි ප්‍රදානෝත්සවය නැරඹීම සඳහා එක් උපාධිලාභියෙකු වෙනුවෙන් ආරාධිතයින් දෙදෙනෙකුට ප්‍රවේශපත්‍ර ලබා දෙනු ලැබේ. වයස අවුරුදු 12ට අඩු කිසිවෙකු උපාධි ප්‍රදානෝත්සව ශාලාවට ඇතුළු කරගනු නොලැබේ.

**අනුපස්ථිතියෙහි උපාධිය ලබා ගැනීම :**

ඔබට කිසියම් දුෂ්කරතාවයක් නිසා මෙදින උපාධි ප්‍රදානෝත්සවයට පෞද්ගලිකව සහභාගී විය නොහැක්කේ නම් උපාධි ප්‍රදානෝත්සව ශාලාවේ දී ඔබේ නම ප්‍රකාශයට පත් කොට උපාධිය පිරිනමනු ඇත. එහෙත් ඒ සඳහා ද ඔබ පෙර සඳහන් කළ පරිදි නියමිත ගාස්තු ගෙවා ලියාපදිංචි වී සිටිය යුතු ය.

**උපාධි සහතික නිකුත් කිරීම :**

පහත සඳහන් ලිපි ලේඛන සියල්ල ඉදිරිපත් කළ පසු උපාධි සහතිකය ලබා ගත හැකිය.

01. විජිනිපත්, ලෝගු සහ සාටක විශ්වවිද්‍යාලයට ආපසු භාර දුන් බවට අභ්‍යන්තර විභාග අංශය විසින් නිකුත් කරන ලද සහතිකය
02. පුස්තකාලයට කිසිවක් අයවීමට නොමැති බව සඳහන් පුස්තකාලයෙන් නිකුත් කරනු ලබන සහතිකය
03. නේවාසිකාගාර පරිහරණයේ දී තමන් ලබා ගත් අදාළ භාණ්ඩ නිසි පරිදි භාර දුන් බවට නේවාසිකාගාර උපපාලක විසින් නිකුත් කරනු ලබන සහතිකය

පුස්තකාලයට හෝ නේවාසිකාගාරයට ඔබ විසින් ගෙවිය යුතු කිසිවක් තිබේ නම්, ඒ සියල්ල කල් ඇතිව නිරවුල් කර ගැනීම ඔබගේ පහසුව පිණිස වනු ඇත.

**උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වීම :**

උපාධි ප්‍රදානෝත්සවය ප.ව. 1.00ට ආරම්භ වන බැවින්, සියලුම උපාධිලාභීන් හා ඔවුන්ගේ ආරාධිතයන් ප.ව. 12.00 සිට 12.45 දක්වා කාලය තුළ ශාලාවට පැමිණ අසුන් ගෙන සිටිය යුතු වේ. උපාධිලාභීන්ට ආසන සඳහා වෙනම අංකයක් නිකුත් කරන අතර, අංකයට අදාළව අසුන් ගැනීම ඔබ වහන්සේගේ/ඔබගේ වගකීම වේ. ප.ව. 12.45න් පසු ශාලාවට ඇතුළුවීමට කිසිසේත් ම ඉඩ දෙනු නොලැබේ.

මහා මහෝපාධ්‍යාය පෙරහර ශාලාවට පිවිසෙන විට සියලු දෙනා ම තම අසුන්වලින් නැගී සිටිය යුතු අතර, ආරම්භක ගාථා සජ්ඣායනයෙන් පසු අසුන් ගත යුතුය. උපාධි ප්‍රදානෝත්සවය අතරතුරේ දී කිසිම හේතුවකට ශාලාවෙන් පිටතට යාමට අවසර දෙනු නොලැබේ. උපාධි ප්‍රදානෝත්සවය අවසානයේ දී මහා මහෝපාධ්‍යායයන් වහන්සේගේ පෙරහර පිටත්වන විට අසුන්වලින් නැගී සිටිය යුතු අතර, පෙරහර ශාලාවෙන් පිටත් වූ පසු ශාලාවෙන් පිටවිය යුතු ය.

මෙයට,

මල්කා හේවාවිතාරණ
සහකාර ලේඛකාධිකාරී (අභ්‍යන්තර විභාග) - වැඩබලන
ලේඛකාධිකාරී වෙනුවට